සියලුම හිමිකම් ඇවිරිණි / All rights Reserved

මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Mathugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

| 09 ශ්‍රේණිය | ගණිතය | I, II පත්‍රය | පැය දෙකයි |
|---|---|---|---|

**නම : ........................................................................................................................................**

**සැලකිය යුතුයි**

- **01 සිට 20 දක්වා ප්‍රශ්න සියල්ලටම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.**

01. පොදු පදය $2n + 5$ වූ සංඛ්‍යා රටාවේ හයවන පදය සොයන්න.


02. $1001_{දෙක}$ යන ද්විමය සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

03. සුළු කරන්න. $\frac{6}{7} \times \frac{1}{3}$

04. රු. 650 ලෙස මිල ලකුණු කර ඇති ළමා කතා පොතක් මිලදී ගැනීමේදී 10% ක වට්ටමක් හිමි වේ. එම පොත සඳහා ගෙවිය යුතු මිල කීයද ?

05. $x^2 + 5x + 6$ යන වර්ගජ ප්‍රකාශනයෙහි සාධක සොයන්න.

06. AB යනු සරල රේඛාවකි. $x$ හි අගය සොයන්න.





07. $p = 2$ ද $q = \frac{1}{3}$ ද නම් $pq^2$ හි අගය සොයන්න.

08. මෙම බඳුනට ජලය $650\,ml$ ක් වත් කළ විට බඳුනෙන් හරි අඩක් පිරේ. බඳුනේ ධාරිතාවය කොපමණද ?




09. $2y = 4x + 6$ සරල රේඛාවේ අනුක්‍රමණය කීයද ?

10. AB හා CD යනු සමාන්තර රේඛා යුගලකි. $x$ හි අගය සොයන්න.





11. සුළු කරන්න. $x^3 \div (x \times x^2)$

12. පහත සංඛ්‍යා අතුරින් ආසන්න 100 ට වැටයූ විට එකම අගයක් ලැබෙන සංඛ්‍යා දෙක තෝරන්න.

395, 480, 410, 570

13. විසඳන්න. $\frac{x+5}{2} = 6$


14. ABC ත්‍රිකෝණයේ BC පාදය D තෙක් දික්කර ඇත. $x$ හි අගය සොයන්න.




15. $v = u + at$ සූත්‍රයේ $t$ උත්ක කරන්න.


16. විෂ්කම්භය 14 cm වන වෘත්තයක පරිධිය සොයන්න. $\left(\pi = \frac{22}{7}\right)$

17. රූපයේ දැක්වෙන තොරතුරු අනුව XY පාදයේ දිග සොයන්න.





18. AB = $x$ ද  CD = $x + 5$ ද නම්  2AB – CD හි අගය $x$ ඇසුරින් සොයන්න.

19. දිග 20 cm ද පළල 15 cm ද වූ සෘජුකෝණාස්‍රාකාර කඩදාසියකින් පළල $x$ වූ සෘජුකෝණාස්‍රාකාර කොටස් 02 ක් කපා ඉවත් කරන ආකාරය රූපයේ අඳුරුකර දක්වා ඇත. අඳුරු නොකළ ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න.




20. A හා B ලක්ෂ්‍ය දෙකට සම දුරින් පිහිටි ලක්ෂ්‍යවල පථය සොයා ගැනීමට රුවන්ට අවශ්‍ය විය. ඔහු ඒ සඳහා පළමුව A හා B ලක්ෂ්‍ය දෙක යා කළේය. මෙම රූපයේ ඉහත පථය නිර්මාණය කරන්න.




## II පත්‍රය

- **පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, අනෙක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.**

01. a) ඔබ උගත් මූලික පථ ඇසුරින් පහත වගන්තිවල හිස්තැන් පුරවන්න.

i. අචල ලක්ෂ්‍යකට නියත දුරින්, එකම තලයක පිහිටි ලක්ෂ්‍ය වල පථය ............................................ කි.

ii. ඡේදනය වන සරල රේඛා දෙකකට සමදුරින් පිහිටි ලක්ෂ්‍යවල පථය වන්නේ එම රේඛා දෙක ඡේදනය වීමෙන් සෑදෙන කෝණයේ .............................................................................. වේ.

b) i. 6 cm දිග සරල රේඛා ඛණ්ඩයක් ඇඳ එය AB ලෙස නම් කරන්න.

ii. AB රේඛාවෙහි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න. එය AB රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය D ලෙස නම් කරන්න.

iii. $B\hat{A}C = 60^0$ වන ලෙස A හිදී $60^0$ කෝණයක් නිර්මාණය කර ඉහත ලම්බ සමච්ඡේදකය මත C ලක්ෂ්‍යය ලබා ගන්න.  $A\hat{C}B$ හි අගය මැන ලියන්න.

iv. $B\hat{A}C$ හි කෝණ සමච්ඡේදකය නිර්මාණය කරන්න.  මෙම කෝණ සමච්ඡේදකයත්, ඉහත ලම්බ සමච්ඡේදකයත් ඡේදනය වන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

v. O කේන්ද්‍රය වන, OD අරය වන වෘත්තය නිර්මාණය කරන්න. එහි අරය මැන ලියන්න.

02. a) පහත සමීකරණ විසඳන්න.

i. $x + 5 = 7$ ii. $\frac{x}{3} - 1 = 3$ iii. $2(x + 5) = 18$

b) පහත සමගාමී සමීකරණ යුගලය විසඳන්න.

$x + y = 8$

$x + 3y = 14$

03. $y = 2x - 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න සකස් කළ අසම්පූර්ණ අගය වගුවක් මෙහි දැක්වේ.

| $x$ | -2 | -1 | 0 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | -5 | -3 | -1 | 1 | …… | 5 | 7 |

i. $x = 2$ වන විට $y$ හි අගය සොයන්න.

ii. සුදුසු බණ්ඩාංක තලයක ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

iii. මෙම සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.

iv. මෙම සරල රේඛාවේ අන්තඃඛණ්ඩය සොයන්න.

v. මෙම සරල රේඛාවට සමාන්තරව (0,3) ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ සමීකරණය ලියන්න.

04. a) කොපි පොත් 5 ක මිල රු. 600 කි. එවැනි කොපි පොත් 08 ක මිල සොයන්න.

b) ඒකාකාර වේගයෙන් ජලය ගලා යන නලයකින්, ධාරිතාවය ලීටර් 300 ක ටැංකියකින් පිරවීමට මිනිත්තු 30 ක් ගත වේ. එම නලය භාවිතයෙන් ධාරිතාවය ලීටර් 500 වූ ටැංකියක් පිරවීමට ගත වන කාලය සොයන්න.

c) ඇමරිකානු සමාගමක සේවය කරන සුරංගගේ මාසික වැටුප ඇමරිකානු ඩොලර් 350 කි. ඇමරිකානු ඩොලරයක විනිමය අනුපාතය රු. 285 ක් නම්, ඔහුගේ මාසික වැටුප ශ්‍රී ලංකා රුපියල් කොපමණද ?

05. a) අගය සොයන්න.

i. $\left(\frac{2}{3}\right)^2$ ii. $(2^2)^3 + 3^0$

b) ධන දර්ශක ඇසුරින් දක්වන්න. $\frac{x^{-3} \times x^2}{xy}$

c) i. 78943 සංඛ්‍යාව විද්‍යාත්මක අංකනයෙන් ලියා දක්වන්න.

ii. 9998 සංඛ්‍යාව ආසන්න 10 ට වටයන්න.

06. සෙල්ලම් කරත්තයක ඇති රෝදයක විෂ්කම්භය 28 cm විය. $\pi = \frac{22}{7}$ ලෙස ගෙන පහත අගයන් සොයන්න.

i. එම රෝදයේ අරය සොයන්න.


ii. එම රෝදයේ පරිධිය සොයන්න.

iii. රෝදය වට 3 ක් කරකැවෙන විට මෙම කරත්තය කොපමණ දුරක් ගමන් කරයිද ?

iv. එකිනෙකට 22 m ක් දුරින් පිහිටි A හා B ලක්ෂ්‍ය දෙක අතර ගමන් කිරීමේදී මෙම රෝදය වට කීයක් කරකැවේද ?

07. රූප සටහනේ දක්වා ඇති තොරතුරු ඇසුරින් a, b, d අගයන් සොයන්න.

අදාළ ප්‍රමේයයන් සඳහන් කරමින් ඔබේ පිළිතුරු ලබාගත් ආකාරය දැක්විය යුතුය.



PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න